වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා කජු සංස්ථාව

ප්‍රසම්පාදන දැන්වීමයි

කජු පොහොර මිලදීගැනීම - 2026 වසර

ප්‍රසම්පාදන අංකය : SLCC/PRO/2026/105 – 2026-23

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ කජු වතුයායන්හි ඵලදරන කජු වගාව සඳහා යෙදීමට අවශ්‍ය පහත සඳහන් කජු පොහොර මිලදීගැනීමට **ජාතික පොහොර ලේකම් කාර්යාලයේ ලියාපදිංචි පිළිගත් සැපයුම්කරුවන් මඟින්** මුද්‍රා තබන ලද මිල ලංසු කැඳවනු ලැබේ.

අයිතම අංකය	අයිතමය	ඉල්ලුම්කර ඇති ප්‍රමාණය	කිලෝ ග්‍රෑම් 50 බැග් වලින්
01.	UREA	කි.ග්‍රෑ. 29400	588
02.	E.R.P.	කි.ග්‍රෑ. 34200	684
03.	M.O.P.	කි.ග්‍රෑ. 19200	384

මිල ලංසු කැඳවීම ජාතික තරහකාරී ලංසු කැඳවීම (NCB) මඟින් සිදුකරනු ලැබේ.

මිල ලංසු ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ නිල වෙබ් අඩවියෙන් (www.cashew.gov.lk) හෝ රත්මලාන ශ්‍රී ලංකා කජු සංස්ථා ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයෙන් **2026.10.16** දින සිට **2026.10.29** වන දින ප.ව. **1.30** දක්වා ලංසු ලේඛන බාගත (Download) / ලබාගත හැකිය. ලංසු ලේඛන ලබාගැනීමට ආපසු නොගෙවනු ලබන රු: **3,500.00** ක (රුපියල් තුන්දහස් පන්සීයක් පමණි) තැන්පතුවක් සංස්ථා ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත මුදලින් ගෙවා හෝ සංස්ථාවේ ලංකා බැංකුව කොල්ලුපිටිය II ශාඛාවේ අංක. 1633705 දරණ ගිණුම වෙත බැර කර, ලංසු ඉදිරිපත් කරන අවස්ථාවේදී අදාල ලදුපතේ පිටපතක් මිල ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය.

මිල ලංසු ඉදිරිපත් කිරීමේදී ආපසු ගෙවනු ලබන රු: **162,800.00** ක (රුපියල් එක්ලක්ෂ හැට දෙදහස් අටසීයක් පමණි) ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතුය. ලංසු /යෝජනා වලංගු දිනෙන් ඔබ්බට දින විසි අටක් (28) දක්වා වලංගු විය යුතු අතර, මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලුවිට ගෙවීම් සිදුකල යුතු, ආපසු හැරවිය නොහැකි ලෙස ඉදිරිපත් කර තිබිය යුතුය. මුදල් තැන්පතුවක් මඟින් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කරන්නේ නම්, 2026.10.29 වන දින ප.ව. 1.30 ට ප්‍රථම ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සරප් වෙත මුදලින් ගෙවා හෝ සංස්ථාවේ ලංකා බැංකුව කොල්ලුපිටිය II ශාඛාවේ අංක. 1633705 දරණ ගිණුම වෙත බැර කර, මුදල් ගෙවූ බවට ඒ සඳහා වූ ලදුපතෙහි පිටපතක් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය. බැංකුව හරහා මුදල් තැන්පත් කිරීමේදී, **" SLCC/PRO/2026/105–2026/23–BS "** යනුවෙන් අදාල ලදුපතෙහි මුද්‍රණය විය යුතුය.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද මිල ලංසු **"මුල් පිටපත"** හා **"අනු පිටපත"** වශයෙන් පිළියෙල කර, **වම්පස ඉහළ කෙළවරේ උක්ත සඳහන් ප්‍රසම්පාදන නාමය හා අංකය සටහන් කර,** වෙන වෙනම කවර දෙකක බහා, නැවත එම කවර දෙක මුද්‍රා තබන ලද තනි කවරයක බහා, **එම කවරයේ වම්පස ඉහළ කෙළවරේ උක්ත සඳහන් ප්‍රසම්පාදන නාමය හා අංකය සටහන් කර ඉදිරිපත් කළ යුතුය.**

අදාල මිල ලංසු **2026.10.29** වන දින ප.ව. **2.00** හෝ ඊට පෙර ලැබෙන පරිදි **" සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා කජු සංස්ථාව, තෙලවල පාර, රත්මලාන "** යන ලිපිනයට ලියාපදිංචි / කුරියර් තැපෑලෙන් එවීමට හෝ සංස්ථා ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති අංක - 01 ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් බහාලිය හැකිය. ප්‍රමාදව් ලැබෙන සහ නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. **ලංසු විවෘත කිරීම 2026.10.29 ප.ව. 2.05** ට කජු සංස්ථා ප්‍රධාන කාර්යාලයේදී සිදුකරනු ලැබේ. ඒ සඳහා ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගී විය හැක.

මේ සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා කජු සංස්ථාව, තෙලවල පාර, රත්මලාන.
2026.10.16